# **RUAF-FStT-** ව්‍යාපෘතිය

## මඟ පෙන්වීමේ පියවර 1.4

නාගරික නිෂ්පාදකවරුන් සමඟ පවත්වන හැඳින්වීමේ රැස්වීම.

දිනය / කාල වකවානුව          සත්වන සතිය

සහභාගිත්වය          දේශීය කණ්ඩායම
තෝරා ගත් නාගරික නිෂ්පාදන කණ්ඩායමේ සියළුම සාමාජිකයින්

**අරමුණ**

- නිෂ්පාදකයින් හෝ නිශ්චිත සහභාගි වන්නන් ව්‍යාපෘතිය පිළිබඳව දැනුවත් කිරීම හා ඔවුන්ගේ කැපවීම ලබා ගැනීම
- **FStT** නව්‍යකරණ ව්‍යාපෘතියේ මූලිකාංග පිළිබඳව පැහැදිලි කිරීම
- විශ්ලේෂණ ක්‍රියාවලියේ හා සැලසුම්කරණයේ පියවරයන් පැහැදිලි කිරීම සහ ක්‍රියාකාරකම් හා දින වකවානු පිළිබඳව එකඟතාවයකට පැමිණීම
- විශ්ලේෂණ හා ව්‍යාපෘති සැලසුම්කරණ කණ්ඩායමේ නියෝජිතයන් තෝරා ගැනීම (මුලින්ම තෝරා ගැනීමේ අගය නිර්වචනය කරන්න)
- ඔවුන්ගේ ඵලදායි සම්පත් ලේඛණ ගත කිරීම

මෙම රැස්වීම අවසානයේදී සහභාගි වූ ගොවි මහතුන් පහත සඳහන් කරුණු පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගත යුතුය

- FStT නව්‍යකරණ ව්‍යාපෘතිය පිළිබඳව
- FStT ව්‍යාපෘතිය විශ්ලේෂණය හා සැලසුම්කරණ අදියරෙහි පියවරයන් පිළිබඳව (මුල් මාස 5)
- FStT ව්‍යාපෘතිය සැලසුම්කරණයේදී දේශීය කණ්ඩායම තුල සිටින ඔවුන්ගේ නියෝජිතයන් කවුරුන්ද යන්න පිළිබඳව
- විශ්ලේෂණ හා සැලසුම්කරණ ක්‍රියාවලියේ තීරණාත්මක අවස්ථාවන්හිදී අනෙකුත් නිෂ්පාදකයින් කවදා කෙලෙස සම්බන්ධ වන්නේ ද යන්න පිළිබඳව
- අවසන් තීරණ ගන්නේ කවදා ද යන්න සහ ව්‍යාපෘතිය ආරම්භ කරන්නේ කවදා ද යන්න පිළිබඳව

**සූදානම් වීම**

- කාලානුරූපීව දේශීය සහභාගිත්වයට ආරාධනා කිරීම සහ ස්ථානය වේලාව හා ගත වන කාලය සහභාගි වන්නන්ට පහසු වන අයුරින් තෝරා ගැනීම වැදගත් වේ විශේෂයෙන් ම කුඩා දරුවන් සිටින කාන්තාවන් සහභාගි වන්නේ නම් සැලකිලිමත් විය යුතුය අවශ්‍ය නම් ප්‍රවාහන පහසුකම් හෝ දිවා ආහාරය සැපයීමෙන් සහය විය හැකිය

- power point ඉදිරිපත් කිරීම් සකස් කිරීම

- කවුරුන් විසින් රැස්වීමේ මූලිකත්වය / සහයෝගය දක්වන්නේ ද යන්න දරන්නේ ද කවුරුන් විසින් රැස්වීම අතරතුර සටහන් තැබීම කරන්නේ ද යන්න හා කෙසේ කුමක් කවර මට්ටමකින් සටහන් කරන්නේ ද යන්න සැලසුම් කිරීම (දේශීය සම්බන්ධීකාරක හැර අන් අයෙක් ඉදිරිපත් කිරීම් සහ ගැටළුවලට පිළිතුරු දීම වඩා සුදුසුය)

**ක්‍රියාත්මක කිරීම**

- ගොවි සංවිධාන නායක විසින් පැමිණ සිටින්නන් පිළිගැනීම දේශීය FStT කණ්ඩායම් නියෝජනය කරන NGO කාර්ය මණ්ඩලය හඳුන්වා දීම (ගොවි නියෝජිතයන් ලෙස තෝරා පත් කර ගැනීමට සිටින අය හා ඔවුන් නියෝජනය කරන සංවිධානය සමඟ හඳුන්වා දීම

- රැස්වීමේ අරමුණු සහ න්‍යාය පත්‍රය පැහැදිලි කිරීම

- FStT නවෳකරණ ව්‍යාපෘතිය යනු කුමක් ද? සහ Market chain perpechve අනුව නාගරික වගා ක්‍රම වැඩි දියුණු කිරීමේ මූලික සිද්ධාන්ත - දේශීය සම්බන්ධීකරණයේ ඉදිරිපත් කිරීම්

- සහභාගී වන්නන්ගේ ගැටළු හා නිරීක්ෂණ ගොනු කර ගැනීම (Flip chart හෝ බිත්ති පුවරු පත්‍රයක මේවා සටහන් කර ගත හැකිය) හා දේශීය සම්බන්ධීකාරක විසින් එම කරුණු පහදා දීම (අනෙකුත් සාමාජිකයන්ට ද මේ සඳහා සහභාගී විය හැකිය)

- දේශීය සම්බන්ධීකාරක විසින් පවතින තත්ත්වය විශ්ලේෂණය කිරීමට අදාල පියවර හා ක්‍රියාකාරකම් ව්‍යාපෘතිය පිළියෙළ කිරීම හා එක් එක් පියවරයන්ට ගත වන කාලය හා ඊට සම්බන්ධයෙන් පිළිබඳව ඉදිරිපත් කිරීම

- සහභාගී වන්නන්ගේ ගැටළු හා නිරීක්ෂණ ගොනු කර ගැනීම ( Flip chart මත හෝ බිත්ති පුවරු පත්‍රයක මේවා සටහන් කර ගත හැකිය) හා දේශීය සම්බන්ධීකාරක විසින් එම කරුණු පහදා දීම (අනෙකුත් සාමාජිකයන්ට ද මේ සඳහා සහභාගී විය හැකිය) තුලින් අවසන් එකඟතාවයන් ට හා දායකත්වයන්ට එළඹීම

- දේශීය ගොවි නියෝජිතයන් තෝරා ගැනීම - එම පිරිස දේශීය විශ්ලේෂණය හා සැලසුම්කරණ කණ්ඩායම සමඟ කටයුතු කරනු ඇත (ඊට පෙර තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය සාකච්ඡා කළ යුතු වේ

- සැමගේ විශ්වාසය දිනා සිටින අඩු වශයෙන් එක් පිරිමියෙකු හා එක් කාන්තාවක සාක්ෂරතා හැකියාව ඇති දායකත්වය සැපයීමට විවේකය ඇති අයවළුක් විය යුතුය (කුඩා දීමනාවක් ගෙවනු ලැබේ)

**ද්‍රව්‍ය හා උපකරණ**

- power point ඉදිරිපත් කිරීම්

- FStT ව්‍යාපෘතිය යනු කුමක් ද? හා එහි මූලිකාංග

- power point ඉදිරිපත් කිරීම් විශ්ලේෂණ හා ව්‍යාපෘති සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවරයන් පිළිබඳ දැක්ම

- 1.4.1 වගුව - දේශීය නිෂ්පාදන සම්පත් ලේඛණය

**නිමැවුම් හා වාර්තාකරණය**

- හැඳින්වීමේ රැස්වීම වාර්තාකරණයේදී පහත කරුණු අඩංගු විය යුතුය

    - නිෂ්පාදකයන් විසින් මතු කරන ලද ප්‍රධාන ගැටළු හා යෝජනා දේශීය කණ්ඩායම ඒවාට ලබා දුන් පිළිතුරු හා ප්‍රධාන / මූලික කාරණාවලට අදාල අවසන් එකඟවීම්

    - දේශීය කණ්ඩායම හා නිෂ්පාදකයන් වෙතින් ලද දායකත්වය
    - දේශීය නිෂ්පාදන සම්පත් ලේඛණයේ ප්‍රතිඵල